ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax
ඊමේල් / ஈ-மெயில் / E-mail landcom@landcommdept.gov.lk

01 DEC

මගේ අංකය / எனது இல / MY NO 5/2/6/රන්බිම/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO
දිනය / திகதி / DATED 2011/11/16

**චක්‍රලේඛ අංක - 2011/06**

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියළුම නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**දීර්ඝකාලීන බදු බලපත්‍ර ඉඩම්, ජයභූමි ඉඩම් සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම සඳහා වූ ඉඩම් මැනීම.**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම මත මැනුම් කටයුතු වල යම් ප්‍රමාදවීමක් ඇතිවීම ක්ෂේත්‍රයේ පවතින ඉඩම් ගැටළු කඩිනමින් විසඳීමට නොහැකි වන එක් ප්‍රධාන කරුණක් බව හඳුනාගෙන ඇති අතර එමඟින් සිදුවිය හැකි මහජන අපහසුතාවය මගහරවා ගැනීම සඳහා මැනුම් කටයුතු වලදී ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ සහය ලබා ගැනීමට මැනුම්පතිවරයා විසින් තීරණයක් ගෙන ඇත.

ඒ අනුව මින් ඉදිරියට අදාළ මැනුම් කටයුතුවල දී පහත පරිදි කටයුතු කිරීමට වගබලා ගත යුතු බව හා ඒ අනුව සහතික කර නිකුත් කරන පිඹුරු පිටපත් අදාළ කටයුතු සඳහා යොදා ගත යුතු බව දන්වමි.

**01. දීර්ඝකාලීන බදු බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් මැනීම.**

දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාගැනීම සඳහා අනුමැතිය ලත් ඉඩම්, තමාගේ වියදමින් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ලවා මැන ගැනීමට බදුකරුට අවස්ථාව ලබාදිය හැකිය. එවැනි අවස්ථාවලදී අදාළ බදුකරු විසින් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු තෝරා ගෙන ප්‍රාදේශීය ලේකම් මගින් දීර්ඝකාලීන බදු බලපත්‍ර සඳහා අනුමැතිය ලැබී ඇති බව දන්වන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපි අංකය සහිතව මැනුම් ඉල්ලීමක් මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

එවැනි ඉල්ලීමක් ලද පසු මිනින්දෝරු අධිකාරි විසින් මැනුම්පතිගේ චක්‍රලේඛ අංක 2/2008 හි මිල ගණන් වලට අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ගාස්තු ලෙස 15% ක

මුදලක් බදුකරු වෙතින් අය කරනු ඇත. අනතුරුව තෝරා ගත් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා ලවා, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් රෙගුලාසි වලට අනුව, තම අධීක්ෂණය යටතේ අදාළ මැනුම සිදු කොට මැනුම්පතිගේ පිඹුරක් සකස් කර, සහතික කළ පිටපත් නිකුත් කිරීම ඉතාමත් කෙටි කාලයක් තුළ සිදු කරනු ඇත. එම පිඹුරේ සහතික කළ පිටපතක් බදුකරු වෙත ද නිකුත් කරනු ඇත.

## 02. ජයභූමි දීමනාපත්‍ර නිකුත් කර ඇති ඉඩම් මැන සැලසුම් සකස් කිරීම.

මගේ අංක 5/2/රුස්වීම්/2005 සහ 2005.06.10 දරණ ලිපිය අනුව ජයභූමි දීමනාපත්‍ර නිකුත් කළ ඉඩම් මැනීම, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු නොකිරීම තවදුරටත් ක්‍රියාත්මක වනු ඇත. නමුත් උක්ත මගේ ලිපිය අනුව පෙන්වා දී ඇති පරිදි, ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ජයභූමි දීමනාපත්‍ර නිකුත් කර ඇති ඉඩම් මැනීමේදී, ඉඩම් මැනීම සඳහා වූ ජාතික පාලන ලක්ෂ ජාලයකට සම්බන්ධ කර ඇත්ද යන්න පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඇති නොහැකියාව මත පහත පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇත.

ජයභූමි දීමනාපත්‍රලාභියකු විසින් ඉඩම් මැනීම අපේක්ෂා කරන විට දීමනාපත්‍රලාභියා විසින්ම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු තෝරා ගෙන, ප්‍රාදේශීය ලේකම් මගින් මැනුම් ඉල්ලීමක්, දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලීමක් ලදපසු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් උක්ත අංක 1 හි 2 ඡේදය යටතේ සඳහන් පරිදි අධීක්ෂණ ගාස්තු අයකිරීමට හා මැනුම්පතිගේ පිඹුරක් සකස් කොට සහතික කර නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. මෙහිදී මගේ අංක 5/2/රුස්වීම්/2005 සහ 2005.06.10 දරණ ලිපියේ අමතර කරුණු තවදුරටත් වලංගු වනු ඇත.

## 03. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම සඳහා වූ ඉඩම් මැනීම.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාගැනීමට අදාළ ඉඩම්, තමන්ගේ පෞද්ගලික වියදමින් මැනගැනීමට බලාපොරොත්තු වන අයට ඒ සඳහා අවස්ථාව ලබාදිය හැකිය. දීමනාපත්‍ර ලබාදීම සඳහා එක් ඉඩමක් හෝ ඉඩම් කැබලි කිහිපයක් එකට යාව සිටින සේ ඇති විට (කැබලි 5, 10, 15 හා ඊට වැඩි අවස්ථාවලදී)එම අයදුම්කරු හෝ අයදුම්කරුවන් සියළු දෙනාම එකට එකතු වී ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු තෝරාගෙන ප්‍රාදේශීය ලේකම් මගින් අයදුම්කරුවන්ගේ නාම ලේඛණය සහතික කර මැනුම් ඉල්ලීමක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අවස්ථාවලදී ද ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් උක්ත අංක 1 හි 2 හි ඡේදය යටතේ සඳහන් පරිදි අධීක්ෂණ ගාස්තු අය කිරීමට හා මැනුම්පතිගේ පිඹුරක් සකස් කොට සහතික කර නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් අංක 1, 2 සහ 3 යන අවස්ථා වලදී සඳහන් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා තෝරා ගැනීම දීමනාපත්‍රකරු විසින්ම සිදු කර ගත යුතු වන අතර ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා සම්බන්ධව [illegible] යුතු වන සියලු ගාස්තු දීමනාපත්‍රකරු / බදුකරු විසින්

දැරිය යුතුවේ. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයා තෝරාගැනීම කිසිසේත්ම ඔබ විසින් සිදු නොකළ යුතු අතර ඒ සඳහා වන ගෙවීම් පිළිබඳ කිසිදු මැදිහත්වීමක් හෝ වගකීමක් ඔබ විසින් භාර නොගත යුතුය.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් - 01. ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

02. මැනුම්පති
මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මැනුම්පතිගේ පරිපාලන චක්‍රලේඛ 03/2011 හා ඔහුගේ අති/.ස.ජ (ක්ෂේත්‍ර)/සී.ඒ./ඊ 69 අංක දරණ 2011.08.17දිනැති චක්‍රලේඛ ප්‍රතිපාදන මත නිකුත් කරන ලදී.
කාරුණික දැනගැනීම සඳහා